**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 01/95**

මගේ අංකය: IV/2/9/170(එම්)75/15
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, වැවිලි
කර්මාන්ත හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍ර , කොළඹ 07,
1995.01.13 වෙනි දින

සියළුම ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

**මැතිවරණ වලට තරග කිරීම පිණිස රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**
**<u>අංක 44/90 යටතේ විශ්‍රාමගත් රජයේ නිලධාරීන්</u>**

1994 පාර්ලිමේන්තු මහ මැතිවරණයට තරග කිරීමේ අරමුණින් 1990.10.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූ නිලධාරීන් පහත සඳහන් කොන්දේසි සපුරා තිබේ නම් නැවත සේවයට කැඳවිය හැකිය.

(අ) ඔවුන් ආයතන සංග්‍රහයේ xxxii පරිච්ඡේදය ප්‍රකාර දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීමට හිමි කමක් නොමැති රාජ්‍ය නිලධාරීන් ගණයට වැටෙන අය විය යුතුය.

(ආ) ප්‍රමාණවත් මනාප සංඛ්‍යාවක් ලබා නොගැනීම නිසා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් තේරී පත්වීමට නොහැකි වූ අය විය යුතුය.

(ඇ) නැවත සේවය ලබා දෙන ලෙස ඔවුන් විසින් ඉල්ලීමක් කර තිබිය යුතුය.

(ඈ) ඔවුන් විකල්ප විශ්‍රාම ගැනීමේ වයසට අඩු පුද්ගලයන් විය යුතුය.

02. එකී නිලධාරීන් විශ්‍රාම ගත් දින සිට නැවත සේවයේ පිහිටුවීම අතරතුර කාලය උපයාගත් නිවාඩු වලට හිලව් කලයුතු අතර, ඉතිරියක් වේ නම් ඒවා වැටුප් රහිත නිවාඩු ලෙස සැලකිය යුතුය.

03. තමා සත්‍ය වශයෙන්ම රා.පරි.චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබුයේ අදාල මැතිවරණයට තරග කිරීම සඳහා බවටත්, තමා එකී මැතිවරණයට තරග කල බවටත්, පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කල යුතුය.

04. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 1991 දී පවත්වන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීමටත් 1993 දී හා 1994 පවත්වන ලද පළාත් සභා ඡන්ද විමසීම් වලටත්, අදල කරගත යුතුය.

අ.කලෝ/**(ආර්.එස්.ජයරත්න)**
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
වැවිලි කර්මාන්ත හා පාර්ලිමේන්තු
කටයුතු අමාත්‍යාංශය